# ටෙන්ඩර් කැඳවීම

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

## ශ්‍රී ලංකා මහ බැංකුවේ භෝජනාගාර සේවා පවත්වා ගෙන යාම සඳහා නැවත ටෙන්ඩර් කැඳවීම

**ශ්‍රී ලංකා මහ බැංකුවේ භෝජනාගාර සේවා සැපයීමේ සේවාදායකයාගේ ගිවිසුම කල් පිරීමට නියමිත බැවින් 2022.10.15 දින සිට වසර 02ක කාලයක් සඳහා ශ්‍රී ලංකා මහ බැංකු භෝජනාගාරය පවත්වාගෙන යාම සඳහා පළපුරුදු සැපයුම්කරුවන්ගෙන් ටෙන්ඩර් අයදුම්පත් කැඳවනු ලැබේ.**

1. 2022.06.30 දිනට පහත පළපුරුද්ද ඇති ලියාපදිංචි ආයතන හෝ පුද්ගලයන් ටෙන්ඩරය සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබයි

   අ) පසුගිය වසර 5 ඇතුළත, අවම වශයෙන් වසර 1ක අඛණ්ඩ කාලයක් සඳහා ආයතන/ආයතනයන් වෙත භෝජනාගාර සේවාවන් සැපයීම

   හා /හෝ

   ආ) පසුගිය වසර 2 තුළ ආහාරපාන සේවා (catering) සපයා තිබීම.

2. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් ගිවිසුම් කාල සීමාව තුළ ඉහත සඳහන් සේවා සැපයීම වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කරනු ලබන වටිනාකමින් යුතු කාර්ය සාධන සුරක්ෂණයක් (Performance Guarantee) ලබාදිය යුතු අතර ලිඛිත ගිවිසුමකට එළඹීමද සිදුවිය යුතුය.

3. මෙම ටෙන්ඩරයට අදාළ නියමයන් සහ කොන්දේසි, ටෙන්ඩර් ලියකියවිලි සමඟ නිකුත් කෙරෙනු ඇත.

4. ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන සැපයුම්කරුවන් හට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අපේක්ෂිත සේවාවන් පිළිබඳ නිශ්චිත කරුණු දැක්වීම සඳහා පූර්ව හමුවක් (Pre Bid Meeting) 2022.08.24 දින පෙ.ව. 11:00 ට ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන කාර්යාලයේ බිම් මහලේ පැවැත්වෙන අතර ඒ සඳහා සහභාගී වීම වැදගත් වේ.

5. 2022.08.18 දින සිට 2022.08.31 දින දක්වා සෑම කාර්යාලීය දිනකම පෙ.ව 10.00 සිට ප.ව 2.00 දක්වා ටෙන්ඩර් ලියකියවිලි ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය මණ්ඩල සේවා කළමණාකරණ දෙපාර්තමේන්තුවේ ආපසු නොගෙවනු ලබන රු. 1,000/- ක ගාස්තුවක් ගෙවා ලබාගත හැකිය. ටෙන්ඩර්පත් භාරගැනීම 2022.08.31 දින ප.ව 2.30ට අවසන් වන අතර ඉන් අනතුරුව ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන කාර්යාලයේ බිම් මහලේ දී එම ටෙන්ඩර්පත් විවෘත කරනු ඇත. ටෙන්ඩර්කරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට ටෙන්ඩර් විවෘත කරන අවස්ථාවට සහභාගී විය හැකිය.

**අධ්‍යක්ෂ, කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුව**
**(11 වන මහළ, 4 වන කුළුන)**
**ශ්‍රී ලංකා මහ බැංකුව**
**අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01 දුරකථන: 011-2477482**